# මැතිවරණ දෙපාර්තමේන්තුව
# தேர்தல்கள் திணைக்களம்

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்

ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ මහලේකම් කාර්යාලය
සරණ මාවත, රාජගිරිය (10107)

தேர்தல்கள் செயலகம்,
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk*


| මගේ අංකය : PE/2015/34<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2015.07.03<br>திகதி |
|---|---|---|

තරඟ කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ වල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින්,
ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත,

***පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015***
***මැතිවරණ ප්‍රචාරක කාර්යාල සීමාකිරීම***

2015 අගෝස්තු මස 17 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී මැතිවරණ ප්‍රචාරක කාර්යාල පවත්වා ගෙනයාමේ දී පිළිපැදිය යුතු කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමුකිරීම් වස් මෙම ලිපිය නිකුත් කරනු ලැබේ.

02. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තිය යටතේ පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල සම්බන්ධයෙන් වූ විධි විධාන මෙසේය.

" 73(1) යම් මැතිවරණ කොට්ඨාසයක යම් මැතිවරණයක බලයලත් නියෝජිතයෙකු වන හෝ ස්වාධීන කණ්ඩායම් නායකයකු වන නැතහොත් බලයලත් නියෝජිත හෝ කණ්ඩායම් නායකයාගේ නියෝජිතයෙකු වන තැනැත්තෙකුට,

(අ) ඒ නාමයෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ මැතිවරණය සම්බන්ධයෙන් ඡන්ද විමසීමේ දිනයට ඉහතින්ම වූ දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත ***ඒ මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයෙහි එක් නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලයක්*** හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතුය.

(ආ) ඡන්ද විමසීමේ දිනයට ඉහතින්ම වූ දිනයෙන් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිවම එන දිනයෙන් අවසන්වන කාලය ඇතුළත ඒ මැතිවරණ ***කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලයක්*** හා ඒ මැතිවරණ කොට්ඨාස සඳහා පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තරඟ කරනු ලබන එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් ***එක් නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලයක්*** හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතුය.

73(2) වගන්තියට අනුව යම් බලයලත් නියෝජිතයකුගේ හෝ ස්වාධීන කණ්ඩායම් නායකයකුගේ හෝ අපේක්ෂකයකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය මැතිවරණ කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම (1) වන උප වගන්තියේ විධි විධාන උල්ලංඝණය කිරීමක් නොවන බව සැලකිය යුතුය.

03. ඒ අනුව පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) පමණක් වන අතර, එවැනි කාර්යාල ස්ථාපිත කළ යුතු ආකාරය පහත දැක්වේ.

**** 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වැනි වගන්තිය යටතේ කාර්යාල පිහිටුවීම පිළිබඳ විස්තර සටහන***

| පිහිටුවිය හැකි කාර්යාල වර්ගය | කාර්යාල පිහිටුවීමට බලය ඇති අය | කාර්යාල පවත්වාගෙන යාහැකි කාලය | කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය | පිහිටුවිය හැකි කාර්යාල ගණන | අයදුම් පත්‍රයේ වර්ණය |
|---|---|---|---|---|---|
| නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාල | පක්ෂ ලේකම්/ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක හෝ වෙනත් නියෝජිත | 2015.07.06 දින සිට 2015.08.18 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි. | කහ |
| නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල (i) | පක්ෂ ලේකම්/ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක හෝ වෙනත් නියෝජිත | 2015.07.06 දින සිට 2015.08.15 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ***ඡන්ද කොට්ඨාසය*** | ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | සුදු |
| නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල (ii) | පක්ෂ ලේකම්/ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක හෝ වෙනත් නියෝජිත | 2015.08.16 දින සිට 2015.08.18 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ***මැතිවරණ කොට්ඨාසය*** | මැතිවරණ කොට්ඨාසයකට එකක් බැගින් එක් අපේක්ෂකයකුට | ලා රෝස |
| සාමාන්‍ය පදිංචි නිවස, මැතිවරණ කාර්යාලය ලෙස භාවිතා කිරීම | බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ අපේක්ෂක | 2015.07.06 සිට 2015.08.18 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් අපේක්ෂකයා පදිංචි නිවස | මැතිවරණ කොට්ඨාසයට එක් කාර්යලයක් පමණි | ලා දම් |

කරුණු පැහැදිලි කිරීම

*I. මැතිවරණ කොට්ඨාස*

අංක 1 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ සිට අංක 22 කෑගල්ල මැතිවරණ කොට්ඨාසය දක්වා වූ ***මැතිවරණ කොට්ඨාස 22*** මෙම නමින් හැඳින්වේ. එක් එක් මැතිවරණ කොට්ඨාසය අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ නමින් හැඳින්වෙන අතර, වවුනියා, මන්නාරම, මුලතිව් පරිපාලන දිස්ත්‍රික්ක තුනටම අදාළ මැතිවරණ බල ප්‍රදේශය අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද, යාපනය සහ කිලිනොච්චි පරිපාලන දිස්ත්‍රික්ක දෙකට අදාළ මැතිවරණ බල ප්‍රදේශය අංක. 10 යාපනය මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද හැඳින්වෙන අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය අංක. 13 දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය වශයෙන් හැඳින්වේ.

*II. ඡන්ද ප්‍රදේශය*

උතුරු කොළඹ, මතුගම, රත්තොට, අම්බලන්ගොඩ ආදී වශයෙන් පැරණි මැතිවරණ කොට්ඨාස හඳුන්වනු ලබන්නේ ඡන්ද ප්‍රදේශ වශයෙනි. දිවයිනේ ***ඡන්ද ප්‍රදේශ 160***ක් ඇත.

*III. ඡන්ද කොට්ඨාසය*

යම් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබා ඇති ඡන්ද හිමියන් පදිංචි ප්‍රදේශය ඡන්ද කොට්ඨාසය යනුවෙන් හැඳින්වේ. එක් ඡන්ද ප්‍රදේශයක ඡන්ද කොට්ඨාස ගණනාවක් ඇති අතර අංක 1 සිට පිළිවෙලින් අංක කර ඇත. එක් එක් ඡන්ද කොට්ඨාසය අනුව ඡන්ද හිමි නාමලේඛනය බෙදා වෙන් කළ හැකිය. දිවයිනේ ඡන්ද කොට්ඨාස 12021 ක් ඇත.

*IV. බලයලත් නියෝජිත*

මැතිවරණ කොට්ඨාසයකට තරඟ කරනු ලබන යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් භාරදෙනු ලබන නාමයෝජනා පත්‍රයක මුලින්ම නම සඳහන් අපේක්ෂකයා 15 (4) වගන්තිය

*V. ස්වාධීන කණ්ඩායම් නායකයා*

ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට නාමයෝජනා පත්‍රයේ මුලින්ම නම සඳහන් අපේක්ෂකයා 15 (3) වගන්තිය

04. මෙම සෑම කාර්යාලයක්ම නිවේදිත කාර්යාලයක් වියයුතු අතර, ***නිවේදිත යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීට හෝ සහකාර මැතිවරණ කොමසාරිස්ට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම්දීම වන අතර මැතිවරණ කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ.*** ඡන්ද ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන භූමියේ හැර අනිකුත් ස්ථානවල ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කළ නොහැකි නමුත් 2005 ජනාධිපතිවරණයට අදාළව තරඟ කළ අපේක්ෂකයන්/ ඔවුන්ගේ නියෝජිතයන්/ පක්ෂ ලේකම්වරුන් සමග මැතිවරණ කොමසාරිස්වරයා හා පොලිස්පතිවරයා පැවති සාකච්ඡාවල දී ඇතිවූ එකගතාව මත ***අවසරලත් නිවේදිත කාර්යාලවල පමණක් ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට ඉඩදෙනු ලැබේ. වෙනත් කිසිදු ස්ථානයක හෝ නිසි අවසරය නොලැබූ, කාර්යාලයක හෝ මැතිවරණ ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට ඉඩදෙනු නොලැබේ.*** නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම්දීම සඳහා මේ සමග අමුණා ඇති ආකෘති පත්‍ර වලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් තුනකින් (3) සම්පූර්ණ කර තේරීම් භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර, ඉන් එක් පිටපතක් තේරීම් භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් රඳවාගනු ලැබේ. ඉතිරි පිටපත් දෙක (2) අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය. එවිට පොලිස් ස්ථානාධිපති විසින් එම පිටපත් දෙක මගින් කාර්යාලය පිහිටුවීමට අවසරය ලබා දී එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන එක් පිටපතක් පමණක් ඉල්ලුම්කරු වෙත ලබාදෙනු ඇත. ***එසේ ලබාදෙනු ලබන අවසරය ඇතුළත් ආකෘතිය සෑමවිටම කාර්යාලය පරීක්ෂාවට පැමිණෙන මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් තේරීම්භාර නිලධාරී විසින් යොදවා ඇති නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරීන්ට හෝ පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි අයුරින් තබාගත යුතු වේ.***

05. බලයලත් නියෝජිතයෙකුට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයෙකුට හෝ අපේක්ෂකයකුට තම පදිංචි නිවසේ නැතහොත් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති නිවසේ මැතිවරණ ප්‍රචාරක කාර්යාලයක් පිහිටුවීමට හිමිකම් ඇති අතර, තම පදිංචි නිවස ජනාකීර්ණ බවෙන් අඩු ප්‍රදේශයක පිහිටා ඇත්නම් පමණක් ඉහතින් දක්වා ඇති පරිදි අනුමැතිය ලබාගැනීමෙන් පසුව එම නිවස පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම තුළ වෙනත් ස්ථානයක මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවා ගත හැකිය. අදාළ ග්‍රාම නිලධාරී වසමින් බැහැරව “නිවස” ලෙස ඡන්ද කාර්යාල පිහිටුවීමට අවසර දෙනු නොලැබේ.

06. මෙම කිසිදු කාර්යාලයක් රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පිහිටුවිය නොහැකිය. එසේ වුවද, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලබාදී ඇති තවමත් රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට ස්වකීය නිවසේ කාර්යාලයක් පැවැත්වීමට අවසර ලැබේ. තවද, මෙවැනි වාසස්ථානයක අපේක්ෂකයකු පදිංචි නැත්නම් එවැනි ස්ථානයක කාර්යාලයක් පැවැත්වීමට ඉඩදිය නොහැක.

07. විධිමත් ලෙස අවසරය ලබාගෙන පිහිටුවා ඇති අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාල භූමි තුළ ප්‍රචාරක පුවරු, කටවුට්, දැන්වීම්, සලකුණු ආදිය ප්‍රදර්ශනයට ඉඩ ලබාදීමට තීරණය කර ඇති නමුත් කාර්යාලයට යාබද විදුලි කණු, මහාමාර්ග, පදික වේදිකා, මායිම් තාප්ප ආදියෙහි කිසිදු ආකාරයක දැන්වීම්, කටවුට්, ධජ, පතාක ප්‍රදර්ශනය කළ නොහැකිය. පෙර සඳහන් එකඟතාව මත ලබාදී ඇති අවසරය අයුතු ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නවල දී වලංගු නීතිය අනුව එසේ කිසිදු ස්ථානයක දැන්වීම්, ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කළ නොහැකි යන නියමය ක්‍රියාත්මක කරනු ලැබේ.

08. යම්කිසි පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක කාර්යාලයක, වෙනත් පක්ෂයක හෝ පක්ෂයක අපේක්ෂකයකුගේ පෝස්ටර්, කටවුට් සහ බැනර් ප්‍රදර්ශනය කිරීම සපුරා තහනම්ය. වෙනත් පක්ෂයක හෝ වෙනත් පක්ෂ අපේක්ෂකයකුගේ ඡායාරූප/ නම්, ආවේනික වැකි ප්‍රදර්ශනය කරනු ලබන්නේ නම් එය අනවසර කාර්යාලයක් ලෙස සලකා ඉවත් කරනු ලබනු ඇති අතර, නීති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

09. කිසිදු අවසරලත් පක්ෂ කාර්යාලයක් තේරීම් භාර නිලධාරී කාර්යාලය, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන වැනි ඍජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩුකළ හැකිය. අපේක්ෂකයකුගේ නිවස මෙම සීමාව තුළ පිහිටා ඇත්නම් පෙර සඳහන් දුර සීමා පිළිබඳ නියමය එහි දී බල නොපැවැත්වේ. එමෙන්ම රජයේ පාසැල්, රෝහල්, අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබාගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතන වලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතු වල නිරත වන දරුවන්ට බාධාවන සේ රජයේ පාසැල් ආසන්නයේම ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැලකී සිටින ලෙස ස්වකීය නියෝජිතයන්, ක්‍රියාකාරී ආධාරකරුවන් දැනුවත් කරන සියළුම බලයලත් නියෝජිතයන්, ස්වාධීන කණ්ඩායම් නායකයන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. කෙසේ වුවද රාජ්‍ය ආයතනවල හෝ පාසැල්වල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවන කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

10. සෑම අවසරලත් කාර්යාලයක්ම අවම වශයෙන් 10' X 10' ප්‍රමාණයේ හෝ වියයුතු එනම්, අවම වශයෙන් වර්ග අඩි 100 ක බිම් ප්‍රමාණයකින් යුක්ත විය යුතුය. එමෙන්ම කාර්යාලයක උස අවම වශයෙන් අඩි 8 ක් වත් විය යුතු වේ. තවද, අවසරලත් පක්ෂ කාර්යාල ලෙස හිස් ඉඩම් හෝ එවැනි හිස් ඉඩම්වල ඉදිකරනු ලබන වර්ගඵලය 10' X 10' ට වඩා අඩු කුඩා තාවකාලික ටකරන් මඩු නැතහොත් එවැනි කුඩා පොල්අතු පැල්පත් හෝ අත්හැර දමා ඇති ගොඩනැගිලි පෙන්වමින් අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම් සඳහා ඉඩදෙනු නොලැබේ. එසේවුවද, යම් නාගරික ප්‍රදේශයක ස්ථිර කඩ කාමරයක් වැනි ගොඩනැගිල්ලක වර්ග ප්‍රමාණය වර්ග අඩි 75 දක්වා අඩුවුව ද මැතිවරණ කොමසාරිස් වෙත දන්වා එවැනි ස්ථානයක අවසරලත් පක්ෂ කාර්යාලයක් පිහිටුවීමට අනුමැතිය ඉල්ලා සිටියහොත් ඒ පිළිබඳව සලකා බැලිය හැක.

11. මෙලෙස පිහිටුවනු ලබන කාර්යාලයේ කිසිම විටක ශබ්ද විකාශන යන්ත්‍ර හෝ කට හඬ විස්තාරණය කිරීම හෝ ප්‍රතිඋත්පාදනය කරන මෙගා ෆෝන් වැනි යන්ත්‍ර හෝ භාවිතා කිරීම නොකළ යුතුය. එසේ කිරීමට අවශ්‍ය වන්නේ නම් නිත්‍යානුකූලව අවසර ලබාගත යුතුය. සෑම කාර්යාලයක්ම අවම වශයෙන් දිනකට පැය 4 ක් වත් විවෘතව තැබිය යුතු අතර, පැය 0600 සිට පැය 2200 දක්වා වූ කාල සීමාවෙන් බැහැරව ඡන්ද කාර්යාල විවෘතව තැබීමෙන් වැළකිය යුතුය.

12. තවද, මෙවැනි ඡන්ද කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබද ඇතිවන සේ නැතහොත් මහජනතාවට බාධා ඇතිවන සේ වාහන නවතා තැබීමෙන්, ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස්කරවීමෙන් වැළකිය යුතු අතර, කාර්යාල පරීක්ෂාවට පැමිණෙන පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ නිලධාරීන්ට ඒ සඳහා උපරිම සහාය ලබාදිය යුතුය. ***ඔවුනට බාධා කිරීම් ඡන්ද විමසීම පැවැත්වීමට බාධා කිරීමක් සිදුකළා සේ සලකා ක්‍රියාකරනු ලැබේ.***

13. ආගමික සිද්ධස්ථාන සතු ඉඩම් හෝ ගොඩනැගිලිවල ඡන්ද කාර්යාල පිහිටුවන්නේ නම් ඒ සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතු අතර එවැනි ස්ථානවල ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට ඉඩදෙනු නො ලැබේ.

14. මෙම නියම කිරීම් හේතුවෙන් පූර්ව ඡන්ද විමසීම් වල දී කලක් තිස්සේම ඡන්ද කාර්යාල ලෙස පවත්වනු ලබන ස්ථානවල ඡන්ද කාර්යාල පිහිටුවීමට අපහසුතාවක් ඇතිවන්නේ නම් හා ඡන්ද කොට්ඨාසය තුළ ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් නැතිනම් ඒ සම්බන්ධයෙන් තේරීම් භාර නිලධාරී වෙත කරුණු ඉදිරිපත් කර මැතිවරණ කොමසාරිස්ගේ විශේෂ අනුමැතිය සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබාගත හැක.

15. ඉහත දක්වා ඇති කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාල සීමාතුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම පිණිසය.

16. තවද මෙම නියම සකස් කර ඇත්තේ පසුගිය ඡන්ද විමසීම් වලදී තරඟ කළ දේශපාලන පක්ෂ වල ලේකම්වරුන්ගේ නියෝජිතයන්ගෙන් හා මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධාන වල නිත්‍ය නියෝජිතයින්ගෙන් සමන්විත ඒකාබද්ධ කමිටුවේ එකඟතාවලට අනුව බවද කාරුණිකව සලකණු මැනවි.

මහින්ද දේශප්‍රිය
මැතිවරණ කොමසාරිස්

පිටපත - 1. පොලිස්පති - දැනගැනීම සඳහා සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කාරුණික වනු පිණිස

2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) –
දැනගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කාරුණික වනු පිණිස

3. සියළුම තේරීම් භාර නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වීම් පිළිබඳව විමර්ශනය කිරීමේ නිලධාරීන් -
දැනගැනීම සඳහා සහ බලයලත් නියෝජිතයන් සහ ස්වාධීන කණ්ඩායම් නායකයන් දැනුවත් කර ඔවුන් වෙත මෙම ලිපියේ පිටපත් ලබාදීමට ක්‍රියාකිරීම් වස්

4. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැනගැනීම සඳහා

5. මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ ස්ථාවර කමිටුවේ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් - දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

6. නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන් - දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

7. මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැමිණිලි විමර්ශන කමිටු ප්‍රධානි

............................................................................................
(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක )

ලිපිනය : ..............................................................................................

..............................................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

2015.......................

| පිටපත් තුනකින් පුරවා එම සියලුම පිටපත් මුලින්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් අදාළ කොටස සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත් දෙක අදාළ පොලිස් ස්ථානයටත්, අදාළ කොටස සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔබ වෙතටත් භාර දෙනු ලැබේ. |
|---|

**තේරීම්භාර නිලධාරී,** ........................................ මැතිවරණ කොට්ඨාසය

පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, ............................ (අදාළ පොලිස් ස්ථානය)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015
## මැතිවරණ කාර්යාල පිහිටුවීම

1. කාර්යාල වර්ගය : **නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලය**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   - 2.1. ඡන්ද විමසීම් කාර්යාලයේ ලිපිනය : ..............................................................................................
   ..............................................................................................
   - 2.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : ..............................................................................................
   - 2.3. එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ..............................................................................................
   - 2.4. එම ලිපිනයේ හිමිකාරීත්වය
   (මෙම ස්ථානයේ යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
     - 2.4.1 හිමිකරුගේ නම : ..............................................................................................
     - 2.4.2 එම අයගේ තැපැල් ලිපිනය : ..............................................................................................
     ..............................................................................................
     - 2.4.3 හිමිකරු කැමති බවට අත්සන : ..............................................................................................
     - 2.4.4 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .............................. ජංගම - ..............................

3. **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ යට කී ඡන්ද විමසීමට අදාළව බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක වන ................................................................ ස්වාමීන්වහන්ස/ මහතා/ මිය සඳහා ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයේ හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් මෙහි කාර්යාලය/ ඉඩම/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා මැතිවරණ නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත් ඉහත කී කාර්යාලය පසුපිට සඳහන් උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

............................................................................................
(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක අත්සන)

දිනය : ..............................

| ** බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක විසින් මෙම ඉල්ලීම කළ යුතු ය.* |
|---|

## කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

කාර්යාලයීය ලිපිනය :

..............................................

..............................................

..............................................

ඡන්ද විමසීම් කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන අතර, මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් අඩි 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ට වැඩි) සහ උස අඩි 8' ට වැඩි වන බවත් යෝජිත කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටේ සඳහන් දුර සීමාතුළ පිහිටා නැති බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

..............................................
ග්‍රාම නිලධාරී අත්සන
දිනය : ..............................................

## දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

පොලිස් ස්ථානාධිපති,

පොලිස් ස්ථානය, ...............................................

ඉහත කී ඉල්ලීමට අදාළ ඡන්ද කොට්ඨාස අංක ............ යේ පක්ෂයේ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායක වන................................ ................................ ස්වාමීන්වහන්ස/ මහතා/ මිය විසින් වෙනත් ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වාගෙන යන/ නොයන බව අවශ්‍ය කටයුතු සඳහා වාර්තා කරමි.

...............................................................

තේරීම්භාර නිලධාරී/ සහකාර තේරීම්භාර නිලධාරී

........................................ දිස්ත්‍රික්කය

දිනය : ........................................ නිල මුද්‍රාව

---

## අදාළ පොලිස් ස්ථානාධිපතිගේ ප්‍රයෝජනය සඳහා *

...............................................................................................

( බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක)

කාර්යාලය පිහිටුවීමේ නිවේදනය භාර ගන්නා ලදී.

................................................... නිල මුද්‍රාව

පොලිස් ස්ථානාධිපති අත්සන

පොලිස් ස්ථානය, ............................................. දිනය : ........................................

(* මෙම කාර්යාලය පිහිටුවීමට යම් බාධාවක් නිසාවෙන් ඔබ විරුද්ධ වන්නේ නම් ඒ බව හැකි ඉක්මණින් දුරකථන අංක ................................ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය අමතා එහි සිටින ........................................................ මහතා/ මිය දැනුවත් කරන්න.)

---

**උපදෙස් :**

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තියෙන් ඡන්ද විමසීම් කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. එසේම 74 වගන්තියෙන් ඡන්ද විමසීමට අදාළව රැස්වීමක් පවත්වන ස්ථානයක් තුළ හෝ ඒ ස්ථානයෙහි හා අපේක්ෂකයෙක් ගෙන යැම සඳහා භාවිතා කරන වාහනයක් තුළ හෝ ඒ මත හැර වෙනත් කිසිදු ස්ථානයක අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක් හෝ ප්‍රදර්ශනය කිරීමට ප්‍රතිපාදන සලසා නොමැත. මැතිවරණ කොමසාරිස්වරයා හා දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2005 වර්ෂයේ දී පවත්වන ලද ජනාධිපතිවරණයට අදාළ සාකච්ඡාවල දී පැමිණි එකඟතාවකට අනුව නිසි අවසරයෙන් පිහිටුවන දේශපාලන පක්ෂ කාර්යාල පරිශ්‍රය තුළ යට කී දෑ ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දී ඇත. *මෙම අවසර ලබා දෙන්නේ පහත අවශ්‍යතා සපුරමින් යහපාලනය පවත්වාගෙන යන නීත්‍යානුකූලව පිහිට වූ ඡන්ද විමසීම් කාර්යාලය සඳහා පමණක් බව අවධාරණය කරනු ලබන අතර, එසේ නොවන අවස්ථාවල දී එම කාර්යාලවල කිසිදු අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා අවසර නොදෙන අතර, ඡන්ද විමසීම් කාර්යාල පමණක් පවත්වාගෙන යාමට ඉඩ දෙනු ලැබේ.*
2. මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ක්) හා උස අඩි 8' ක් විය යුතු අතර, කාර්යාලය නියමිත බලය ඇති කාල සීමාව තුළ නිසි අවසරය ඇති සෑම දිනකම අවම වශයෙන් දිනකට පැය 4ක් වත් විවෘතව පවත්වාගෙන යා යුතු ය. (කාර්යාල විවෘත කර තැබිය හැක්කේ උපරිම වශයෙන් පෙ.ව.6.00 සිට ප.ව.10.00 දක්වා පමණි.)
3. පොලීසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය.ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුල ප්‍රදර්ශනය කර තිබිය යුතුය.එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
4. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලය | එක් බලයලත් නියෝජිතයෙකුට හෝ ස්වාධීන කණ්ඩායම් නායකයකුට මැතිවරණ කොට්ඨාසයකට එකක් බැගින් | 2015.07.06 දින සිට 2015.08.18 දින මධ්‍යම රාත්‍රිය දක්වා |

5. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද විමසීම් කාර්යාලයක් ලෙස භාවිතා කළ හැකිය. එසේම අපේක්ෂකයාගේ නිවස ජනාකීර්ණ ස්ථානයක පිහිටා නොමැති අවස්ථාවක දී තේරීම්භාර නිලධාරී වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමක් සලකා බලා නිවස පිහිටි ග්‍රාම නිලධාරී වසම තුළම ඇති ජනාකීර්ණ ස්ථානයක පිහිටි වෙනත් ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.
6. මෙවැනි නිවේදිත මධ්‍ය ඡන්ද විමසීම් කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් ඒවා 2015.08.15 දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු ය.
7. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා තිබුණ ද 2015.08.15 දින මධ්‍යම රාත්‍රියේ සිට එහි ප්‍රදර්ශනය කරන සියලුම අපේක්ෂක ප්‍රවර්ධන දෑ ඉවත් කළ යුතු ය.
8. කිසියම් කිසියම් අපේක්ෂකයෙකු වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදු නොකළ යුතු ය.
9. කිසිදු අවසර ලත් ඡන්ද කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන වැනි සෘජු ලෙසම ඡන්ද විමසීම හා සම්බන්ධිත රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය.
10. රජයේ රෝහල්, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල, උසාවි සංකීර්ණ හෝ රජයේ පාසල් යනාදී පොදු ස්ථාන ආසන්නයේ ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස අපේක්ෂකයන්ගෙන් හා ක්‍රියාකාරී අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර එවැනි ආයතන වල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවනු ලබන ඡන්ද කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

..........................................................................................................
( බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක, නියෝජිත නම)

ලිපිනය : ..........................................................................................

..........................................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් තුනකින් පුරවා එම සියලුම පිටපත් මුලින්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් අදාළ කොටස් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත් දෙක අදාළ පොලිස් ස්ථානයටත්, අදාළ කොටස් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔබ වෙතටත් භාර දෙනු ලැබේ.

2015........................

**තේරීම්භාර නිලධාරී,** ........................................ දිස්ත්‍රික්කය.

**පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය,** ................................ (අදාළ පොලිස් ස්ථානය)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015
## මැතිවරණ කාර්යාල පිහිටුවීම

1. කාර්යාල වර්ගය : **නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලය**

**2015.08.15 දින මධ්‍යම රාත්‍රිය ඉකුත් වීමට පෙර ඉවත් කළ යුතු ය**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   - 2.1. ඡන්ද විමසීම් කාර්යාලයේ ලිපිනය : ..........................................................................................

     ..........................................................................................
   - 2.2 ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : ..........................................................................................
   - 2.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : ..........................................................................................
   - 2.4 එම ලිපිනයේ හිමිකාරීත්වය
     (මෙම ස්ථානයේ යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
     - 2.4.1 හිමිකරුගේ නම : ..........................................................................................
     - 2.4.2 එම අයගේ තැපැල් ලිපිනය : ..........................................................................................

       ..........................................................................................
     - 2.4.3 හිමිකරු කැමති බවට අත්සන : ..........................................................................................
     - 2.4.4 හිමිකරුගේ දුරකථන අංක : නිවස - ...................................... ජංගම - ......................................

3. **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ යට කී ඡන්ද විමසීමට අදාළව බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ ඔවුනගේ නියෝජිත වන ..................................... ..................................... ස්වාමීන්වහන්ස/ මහතා/ මිය සඳහා ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයේ හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් මෙකී කාර්යාලය/ ඉඩම/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා මැතිවරණ නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත් ඉහත කී බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ ඔවුනගේ නියෝජිත වෙනුවෙන් පිහිටුවන මෙම කාර්යාලය පසුපිට සඳහන් උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

..........................................................................
(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත - අත්සන)
දිනය : ................................................ නිල මුද්‍රාව

### කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

කාර්යාලයීය ලිපිනය:............................................................

............................................................

ඡන්ද විමසීම් කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිදු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන අතර, මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් අඩි 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ට වැඩි) සහ උස අඩි 8' ට වැඩි වන බවත් යෝජිත කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටේ සඳහන් දුර සීමාතුළ පිහිටා නැති බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

.....................................................
ග්‍රාම නිලධාරී අත්සන
දිනය : ................................................

## දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

පොලිස් ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, ..............................................

ඉහත කී ඉල්ලීමට අදාළ ඡන්ද කොට්ඨාස අංක ............ යේ පක්ෂයේ/ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායක/ නියෝජිත වන .............................. .............................. ස්වාමීන්වහන්ස/ මහතා/ මිය විසින් වෙනත් ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වාගෙන යන/ නොයන බව අවශ්‍ය කටයුතු සඳහා වාර්තා කරමි.

..............................................................
තේරීම්භාර නිලධාරී/ සහකාර තේරීම්භාර නිලධාරී
.................................. දිස්ත්‍රික්කය

දිනය : ........................................ නිල මුද්‍රාව

---

## අදාළ පොලිස් ස්ථානාධිපතිගේ ප්‍රයෝජනය සඳහා *

..........................................................................................................
(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත වන)
කාර්යාලය පිහිටුවීමේ නිවේදනය භාර ගන්නා ලදී

නිල මුද්‍රාව

..........................................
පොලිස් ස්ථානාධිපති අත්සන
පොලිස් ස්ථානය, .............................................. දිනය : ........................................

(* මෙම කාර්යාලය පිහිටුවීමට යම් බාධාවක් නිසාවෙන් ඔබ විරුද්ධ වන්නේ නම් ඒ බව හැකි ඉක්මණින් දූරකථන අංක .............................. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය අමතා එහි සිටින ........................................................ මහතා/ මිය දැනුවත් කරන්න.)

---

**උපදෙස් :**

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු පනතේ 73 වගන්තියෙන් ඡන්ද විමසීම් කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. එසේම 74 වගන්තියෙන් ඡන්ද විමසීමට අදාළව රැස්වීමක් පවත්වන ස්ථානයක් තුළ හෝ ඒ ස්ථානයෙහි හා අපේක්ෂකයෙක් ගෙන යෑම සඳහා භාවිතා කරන වාහනයක් තුළ හෝ ඒ මත හැර වෙනත් කිසිදු ස්ථානයක අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක් හෝ ප්‍රදර්ශනය කිරීමට ප්‍රතිපාදන සලසා නොමැත. මැතිවරණ කොමසාරිස්වරයා හා දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2005 වර්ෂයේ දී පවත්වන ලද ජනාධිපතිවරණයට අදාළ සාකච්ඡාවල දී පැමිණි එකඟතාවකට අනුව නිසි අවසරයෙන් පිහිටුවන දේශපාලන පක්ෂ කාර්යාල පරිශ්‍රය තුළ යට කී දෑ ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දී ඇත. *මෙම අවසර ලබා දෙන්නේ පහත අවශ්‍යතා සපුරමින් යහපාලනය පවත්වාගෙන යන නීත්‍යානුකූලව පිහිට වූ ඡන්ද විමසීම් කාර්යාලය සඳහා පමණක් බව අවධාරණය කරනු ලබන අතර, එසේ නොවන අවස්ථාවල දී එම කාර්යාලවල කිසිදු අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා අවසර නොදෙන අතර, ඡන්ද විමසීම් කාර්යාල පමණක් පවත්වාගෙන යාමට ඉඩ දෙනු ලැබේ.*

2. මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ක්) හා උස අඩි 8' ක් විය යුතු අතර, කාර්යාලය නියමිත බලය ඇති කාල සීමාව තුළ නිසි අවසරය ඇති සෑම දිනකම අවම වශයෙන් දිනකට පැය 4ක් වත් විවෘතව පවත්වාගෙන යා යුතුය. (කාර්යාලය විවෘත කර තැබිය හැක්කේ උපරිම වශයෙන් පෙ.ව.6.00 සිට ප.ව.10.00 දක්වා පමණි.)

3. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුල ප්‍රදර්ශනය කර තිබිය යුතුය.එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

4. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලය | එක් එක් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට එක් ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | 2015.07.06 දින සිට 2015.08.15 දින මධ්‍යම රාත්‍රිය දක්වා |

5. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද විමසීම් කාර්යාලයක් ලෙස භාවිතා කළ හැකිය. එසේම අපේක්ෂකයාගේ නිවස ජනාකීර්ණ ස්ථානයක පිහිටා නොමැති අවස්ථාවක දී තේරීම්භාර නිලධාරී වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමක් සලකා බලා නිවස පිහිටි ග්‍රාම නිලධාරී වසම තුළම ඇති ජනාකීර්ණ ස්ථානයක පිහිටි වෙනත් ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.

6. මෙවැනි නිවේදිත ශාඛා ඡන්ද විමසීම් කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා ඇත්නම් ඒවා 2015.08.15 දින මධ්‍යම රාත්‍රියේ සිට ඉවත් කළ යුතු ය.

7. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා තිබුණ ද 2015.08.15 දින මධ්‍යම රාත්‍රියේ සිට එහි ප්‍රදර්ශනය කරන සියලුම අපේක්ෂක ප්‍රවර්ධන දෑ ඉවත් කළ යුතු ය.

8. කිසියම් අපේක්ෂකයෙකු වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදු නොකළ යුතුය.

9. කිසිදු අවසර ලත් ඡන්ද කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන වැනි සෘජු ලෙසම ඡන්ද විමසීම හා සම්බන්ධිත රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය.

10. රජයේ රෝහල්, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල, උසාවි සංකීර්ණ හෝ රජයේ පාසල් යනාදී පොදු ස්ථාන ආසන්නයේ ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස අපේක්ෂකයන්ගෙන් හා ක්‍රියාකාරී අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර එවැනි ආයතන වල ක්‍රියාකාරීත්වයට බාධාවන සේ පිහිටුවනු ලබන ඡන්ද කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම :

.......................................................................................................

ලිපිනය : ..............................................................................................

..............................................................................................

දුරකථන අංක : .......................................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් තුනකින් පුරවා එම සියලුම පිටපත් මුලින්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් අදාළ කොටස් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත් දෙක අදාළ පොලිස් ස්ථානයටත්, අදාළ කොටස් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔබ වෙතටත් භාර දෙනු ලැබේ.

2015........................

**තේරීම්භාර නිලධාරී, ............................................ දිස්ත්‍රික්කය.**

**පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය, ............................... (අදාළ පොලිස් ස්ථානය)**

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015
## මැතිවරණ කාර්යාල පිහිටුවීම

1. කාර්යාල වර්ගය :

**එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් මැතිවරණ කොට්ඨාසය සඳහා වූ නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලය**

**2015.08.16,17,18 දින සඳහා පමණි.**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය
   - 2.1. ඡන්ද විමසීම් කාර්යාලයේ ලිපිනය : ..........................................................................................

     ..........................................................................................
   - 2.2. ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : ..........................................................................
   - 2.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : .......................................................................
   - 2.4 එම ලිපිනයේ හිමිකාරීත්වය

     (මෙම ස්ථානයේ යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)
     - 2.4.1. හිමිකරුගේ නම : ..........................................................................................
     - 2.4.2. එම අයගේ තැපැල් ලිපිනය : ..........................................................................................

       ..........................................................................................
     - 2.4.3. හිමිකරු කැමති බවට අත්සන : ..........................................................................................
     - 2.4.4. හිමිකරුගේ දුරකථන අංක : නිවස - .................................. ජංගම - ......................................

3. **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ යට කී ඡන්ද විමසීමට අදාළව බලයලත් නියෝජිත/ ස්වාධීන කන්ඩායම් නායක/ ඔවුනගේ නියෝජිත වන ............................................................... ස්වාමීන්වහන්ස/ මහතා/ මිය සඳහා ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයේ හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත් මෙකී කාර්යාලය/ ඉඩම/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා මැතිවරණ නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත් ඉහත කී කාර්යාලය පසුපිට සඳහන් උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම) : ..........................................................................
..........................................................................................................................................

අත්සන : ....................................................

දිනය : ....................................................

නිල මුද්‍රාව

## කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

කාර්යාලයීය ලිපිනය:..................................................

..................................................

..................................................

ඡන්ද විමසීම කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිඳු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන අතර, මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් අඩි 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ට වැඩි) සහ උස අඩි 8' ට වැඩි වන බවත් යෝජිත කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටේ සඳහන් දුර සීමාතුළ පිහිටා නැති බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

..................................................

ග්‍රාම නිලධාරී අත්සන

දිනය : ........................................

## දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

පොලිස් ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, ..................................................

ඉහත කී ඉල්ලීමට අදාළ ඡන්ද කොට්ඨාස අංක ............ යේ බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/නියෝජිත වන .................................. ................................ ස්වාමීන්වහන්ස/ මහතා/ මිය විසින් වෙනත් ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වාගෙන යන/ නොයන බව අවශ්‍ය කටයුතු සඳහා වාර්තා කරමි.

..................................................................
තේරීම්භාර නිලධාරී/ සහකාර තේරීම්භාර නිලධාරී

.......................................... දිස්ත්‍රික්කය
දිනය : ........................................ නිල මුද්‍රාව

---

## අදාළ පොලිස් ස්ථානාධිපතිගේ ප්‍රයෝජනය සඳහා *

.....................................................................................................................
(බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/ නියෝජිත නම)
කාර්යාලය පිහිටුවීමේ නිවේදනය භාර ගන්නා ලදී.

................................................ නිල මුද්‍රාව
පොලිස් ස්ථානාධිපති අත්සන
පොලිස් ස්ථානය, .................................................. දිනය : ........................................

(* මෙම කාර්යාලය පිහිටුවීමට යම් බාධාවක් නිසාවෙන් ඔබ විරුද්ධ වන්නේ නම් ඒ බව හැකි ඉක්මණින් දුරකථන අංක ................................ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය අමතා එහි සිටින ........................................................ මහතා/මිය දැනුවත් කරන්න.)

---

### උපදෙස් :

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තියෙන් ඡන්ද විමසීම් කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. එසේම 74 වගන්තියෙන් ඡන්ද විමසීමට අදාළව රැස්වීමක් පවත්වන ස්ථානයක් තුළ හෝ ඒ ස්ථානයෙහි හා අපේක්ෂකයෙක් ගෙන යෑම සඳහා භාවිතා කරන වාහනයක් තුළ හෝ ඒ මත හැර වෙනත් කිසිදු ස්ථානයක අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක් හෝ ප්‍රදර්ශනය කිරීමට ප්‍රතිපාදන සලසා නොමැත. මැතිවරණ කොමසාරිස්වරයා හා දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2005 වර්ෂයේ දී පවත්වන ලද ජනාධිපතිවරණයට අදාළ සාකච්ඡාවල දී පැමිණි එකඟතාවකට අනුව නිසි අවසරයෙන් පිහිටුවන දේශපාලන පක්ෂ කාර්යාල පරිශ්‍රය තුළ යට කී දෑ ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දී ඇත. ***මෙම අවසර ලබා දෙන්නේ පහත අවශ්‍යතා සපුරමින් යහපාලනය පවත්වාගෙන යන නීත්‍යානුකූලව පිහිට වූ ඡන්ද විමසීම් කාර්යාලය සඳහා පමණක් බව අවධාරණය කරනු ලබන අතර, එසේ නොවන අවස්ථාවල දී එම කාර්යාලවල අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා අවසර නොදෙන අතර, ඡන්ද විමසීම් කාර්යාල පමණක් පවත්වාගෙන යාමට ඉඩ දෙනු ලැබේ.***
2. මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ක්) හා උස අඩි 8' ක් විය යුතු අතර, කාර්යාලය නියමිත බලය ඇති කාල සීමාව තුළ නිසි අවසරය ඇති සෑම දිනකම අවම වශයෙන් දිනකට පැය 4ක් වත් විවෘතව පවත්වාගෙන යා යුතු ය. (කාර්යාලය විවෘත කර තැබිය හැක්කේ උපරිම වශයෙන් පෙ.ව.6.00 සිට ප.ව.10.00 දක්වා පමණි.)
3. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය. ඊට අමතරව එහි පිටපතක් කාර්යාලය තුල ප්‍රදර්ශනය කර තිබිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
4. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| **එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක්** | **එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් මැතිවරණ කොට්ඨාස සඳහා එකක් බැගින්** | **2015.08.16 දින සිට 2015.08.18 දින මධ්‍යම රාත්‍රිය දක්වා** |

5. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද විමසීම් කාර්යාලයක් ලෙස භාවිතා කළ හැකිය. එසේම අපේක්ෂකයාගේ නිවස ජනාකීර්ණ ස්ථානයක පිහිටා නොමැති අවස්ථාවක දී තේරීම්භාර නිලධාරී වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමක් සලකා බලා නිවස පිහිටි ග්‍රාම නිලධාරී වසම තුළම ඇති ජනාකීර්ණ ස්ථානයක පිහිටි වෙනත් ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.
6. එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් නිවේදිත ශාඛා ඡන්ද විමසීම් කාර්යාලයක් ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටුවිය නොහැක.
7. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා තිබුණ ද 2015.08.15 දින මධ්‍යම රාත්‍රියේ සිට එහි ප්‍රදර්ශනය කරන සියලුම අපේක්ෂක ප්‍රවර්ධන දෑ ඉවත් කළ යුතු ය.
8. කිසියම් අපේක්ෂකයෙකු වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදු නොකළ යුතුය.
9. කිසිදු අවසර ලත් මැතිවරණ කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන වැනි සෘජු ලෙසම ඡන්ද විමසීම හා සම්බන්ධිත රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය.
10. රජයේ රෝහල්, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල, උසාවි සංකීර්ණ හෝ රජයේ පාසල් යනාදී පොදු ස්ථාන ආසන්නයේ ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස අපේක්ෂකයන්ගෙන් හා ක්‍රියාකාරී අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබ ඇති අතර එවැනි ආයතන වල ක්‍රියාකාරීත්වයට බාධාවන සේ පිහිටුවනු ලබන ඡන්ද කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

අපේක්ෂකයාගේ නම .............................................................................

.............................................................................

ලිපිනය : .............................................................................

.............................................................................

දුරකථන අංක : .............................................................................

*(සම්පූර්ණ කිරීමට පෙර පසු පිටේ ඇති උපදෙස් හොඳින් කියවන්න.)*

පිටපත් තුනකින් පුරවා එම සියලුම පිටපත් මුලින්ම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයටත් අදාළ කොටස් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත් දෙක අදාළ පොලිස් ස්ථානයටත්, අදාළ කොටස් සම්පූර්ණ කිරීමෙන් පසුව ඉතිරි පිටපත මැතිවරණ කාර්යාලයේ තබා ගැනීම සඳහා ඔබ වෙතටත් භාර දෙනු ලැබේ.

2015........................

**තේරීම්භාර නිලධාරී,** ........................................ දිස්ත්‍රික්කය.

**පොලිස් ස්ථානාධිපති, පොලිස් ස්ථානය,** ................................ (අදාළ පොලිස් ස්ථානය)

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|
| ඡන්ද ප්‍රදේශ අක්ෂරය | ඡ.කො. අංකය |
| | |

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015
## මැතිවරණ කාර්යාල පිහිටුවීම

1. කාර්යාල වර්ගය : **අපේක්ෂකයාගේ සාමාන්‍ය පදිංචි නිවස**

2. කාර්යාලයේ පිහිටීම හා අදාළ ස්ථානයේ අයිතිය

2.1 අපේක්ෂකයා සාමාන්‍යයෙන් පදිංචි නිවසේ ලිපිනය :.............................................

.............................................................................

2.2 ඉහත ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම : .............................................

2.3 එම ලිපිනයට අදාළ ඡන්ද මධ්‍යස්ථානයේ නම : .............................................

2.4 එම ලිපිනයේ හිමිකාරිත්වය - මෙම ස්ථානයේ අයිතිකරු නොවේනම්,

(මෙම ස්ථානය යම් රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවිය යුතු ය.)

2.4.1 හිමිකරුගේ නම : .............................................

2.4.2 එම අයගේ තැපැල් ලිපිනය : .............................................

.............................................

2.4.3 හිමිකරු කැමති බවට අත්සන : .............................................

2.4.4 හිමිකරුගේ දුරකථන අංක : නිවස - .................................. ජංගම - ..................................

3. **ප්‍රකාශය**

ඉහත තොරතුරු දක්වා ඇති ස්ථානයේ යට කී ඡන්ද විමසීමට අදාළව ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වා ගෙන යාමට අවසරය පතමි. ඉහත ස්ථානය රජයේ හෝ වෙනත් ආයතනයකට හෝ අයිති ස්ථානයක් නොවන බවත්, මෙය මට අයිති ස්ථානය බවත්, මෙකී කාර්යාලය/ ඉඩම/ ගොඩනැගිල්ල අයිති අයගේ අවසරය ලැබී ඇති බවත් සඳහන් කරමි. සාමාන්‍ය නීතිය හා මැතිවරණ නීතිය උල්ලංඝනය නොවන පරිදි කටයුතු කරන බවටත්, මෙම කාර්යාලය පසුපිට සඳහන් උපදෙස්වලට අනුකූලව පවත්වා ගෙන යන බවටත් සහතික වෙමි.

අපේක්ෂකයාගේ නම - .............................................................................

පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් නායකයාගේ නම - .............................................

අත්සන : .............................................

දිනය : ............................................. නිල මුද්‍රාව

*** තරඟ කරනු ලබන අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතු ය.**

## කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරීගේ වාර්තාව

කාර්යාලයීය ලිපිනය:.............................................

.............................................

.............................................

ඡන්ද විමසීම් කාර්යාලය පිහිටුවීමට අදාළ ඡන්ද කොට්ඨාස අංකය ................ වන බවත්, එම ස්ථානය කිසිදු රජයේ ආයතනයකට/ ව්‍යවස්ථාපිත ආයතනයකට අයත් නොවන අතර, මෙම ගොඩනැගිල්ල අවම වශයෙන් අඩි 10' X 10' ප්‍රමාණයේ (වර්ග අඩි 100 ට වැඩි) සහ උස අඩි 8' ට වැඩි වන බවත් යෝජිත කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා පොලිස් ස්ථාන පසු පිටේ සඳහන් දුර සීමාතුළ පිහිටා නැති බවත් වාර්තා කරමි.

නිල මුද්‍රාව

.............................................

ග්‍රාම නිලධාරී අත්සන

දිනය : .............................................

## දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

පොලිස් ස්ථානාධිපති,
පොලිස් ස්ථානය, ................................................

ඉහත කී ඉල්ලීමට අදාළ ඡන්ද කොට්ඨාස අංක ............ යේ 2.1. ලිපිනයේ සාමාන්‍ය පදිංචි අපේක්ෂක ..................... .............................. ස්වාමින්වහන්ස/ මහතා/ මිය විසින් වෙනත් ඡන්ද විමසීම් කාර්යාලයක් පවත්වාගෙන යන/ නොයන බව අවශ්‍ය කටයුතු සඳහා වාර්තා කරමි.

..................................................................
තේරීම්භාර නිලධාරී/ සහකාර තේරීම්භාර නිලධාරී

...................................... දිස්ත්‍රික්කය

දිනය : ........................................ නිල මුද්‍රාව

---

## අදාළ පොලිස් ස්ථානාධිපතිගේ ප්‍රයෝජනය සඳහා *

.......................................................................................................
(අපේක්ෂකයාගේ නම)
පක්ෂයේ නම/ ස්වාධීන කණ්ඩායම් නායකගේ නම - ..........................................................................................

කාර්යාලය පිහිටුවීමේ නිවේදනය භාර ගන්නා ලදී.

.................................................. නිල මුද්‍රාව
පොලිස් ස්ථානාධිපති අත්සන
පොලිස් ස්ථානය, ................................................ දිනය : .......................................

(* මෙම කාර්යාලය පිහිටුවීමට යම් බාධාවක් නිසාවෙන් ඔබ විරුද්ධ වන්නේ නම් ඒ බව හැකි ඉක්මණින් දුරකථන අංක ............................... දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය අමතා එහි සිටින ............................................................ මහතා/මිය දැනුවත් කරන්න.)

---

### උපදෙස් :

1. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තියෙන් ඡන්ද විමසීම් කාර්යාල පිහිටුවීමට නෛතික ප්‍රතිපාදන සලසා දී ඇත. එසේම 74 වගන්තියෙන් ඡන්ද විමසීමට අදාළව රැස්වීමක් පවත්වන ස්ථානයක් තුළ හෝ ඒ ස්ථානයෙහි හා අපේක්ෂකයෙක් ගෙන යෑම සඳහා භාවිතා කරන වාහනයක් තුළ හෝ ඒ මත හැර වෙනත් කිසිදු ස්ථානයක අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, චිත්‍රයක්, දැන්වීමක්, ඡායාරූපයක්, ලකුණක් හෝ සලකුණක් හෝ ප්‍රදර්ශනය කිරීමට ප්‍රතිපාදන සලසා නොමැත. මැතිවරණ කොමසාරිස්වරයා හා දේශපාලන පක්ෂ ලේකම්වරු සමඟ 2005 වර්ෂයේ දී පවත්වන ලද ජනාධිපතිවරණයට අදාළ සාකච්ඡාවල දී පැමිණි එකඟතාවකට අනුව නිසි අවසරයෙන් පිහිටුවන දේශපාලන පක්ෂ කාර්යාල පරිශ්‍රය තුළ යට කී දෑ ප්‍රදර්ශනය සඳහා අවසර ලබා දී ඇත. ***මෙම අවසර ලබා දෙන්නේ පහත අවශ්‍යතා සපුරමින් යහපාලනය පවත්වාගෙන යන නීත්‍යානුකූලව පිහිට වූ ඡන්ද විමසීම් කාර්යාලය සඳහා පමණක් බව අවධාරණය කරනු ලබන අතර, එසේ නොවන අවස්ථාවල දී එම කාර්යාලවල කිසිදු අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා අවසර නොදෙන අතර, ඡන්ද විමසීම් කාර්යාල පමණක් පවත්වාගෙන යාමට ඉඩ දෙනු ලැබේ.***

2. පොලිසිය හෝ වෙන යම් බලධාරියෙකු පැමිණ ඉල්ලා සිටි විටක කාර්යාලය පිහිටුවීමට අනුමැතිය දෙන ලද ලිපිය ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් අදාළ ඡන්ද විමසීම් කාර්යාලය ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

3. කාර්යාල පිහිටුවිය හැකි ආකාරය හා පවත්වාගෙන යා හැකි දින වකවානු මෙසේ ය.

| | | |
|---|---|---|
| **අපේක්ෂකයාගේ සාමාන්‍ය පදිංචි නිවස** | **එක් එක් අපේක්ෂකයා වෙනුවෙන්** | **2015.07.06 දින සිට 2015.08.18 දින මධ්‍යම රාත්‍රිය දක්වා** |

4. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද විමසීම් කාර්යාලයක් ලෙස භාවිතා කළ හැකිය. එසේම අපේක්ෂකයාගේ නිවස ජනාකීර්ණ ස්ථානයක පිහිටා නොමැති අවස්ථාවක දී තේරීම්භාර නිලධාරී වෙත කෙරෙන ලිඛිත ඉල්ලීමක් සලකා බලා නිවස පිහිටි ග්‍රාම නිලධාරී වසම තුළම ඇති ජනාකීර්ණ ස්ථානයක පිහිටි වෙනත් ගොඩනැගිල්ලක් ඒ සඳහා යොදා ගැනීමට අවසර දෙනු ලැබේ.

5. අපේක්ෂකයා පදිංචි නිවස ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර් 500 සීමාවේ පිහිටා තිබුණ ද 2015.08.15 දින මධ්‍යම රාත්‍රියේ සිට එහි ප්‍රදර්ශනය කරන සියලුම අපේක්ෂක ප්‍රවර්ධන දෑ ඉවත් කළ යුතු ය.

6. කිසියම් අපේක්ෂකයෙකු වෙනුවෙන් පිහිටුවන කාර්යාලය තුළ වෙනත් අපේක්ෂකයෙකුගේ ප්‍රචාරක කටයුතු සිදු නොකළ යුතු ය.

7. කිසිදු අවසර ලත් මැතිවරණ කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පොලිස් ස්ථාන වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබා ගැනීම සඳහා යන එන රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ.

8. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහනගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය.